**කොළඹ අග නගර ආශ්‍රිත ජල ගැල්මෙන් පසු යථා තත්ත්වයට පත්වන නාගරික පරිසරය උදෙසා වූ භාර අරමුදල - 2015**

-----------------------------------------------------------------------------------------------------------

කොළඹ අග නගර ආශ්‍රිත ජල ගැල්මෙන් පසු යථා තත්ත්වයට පත්වන නාගරික පරිසරය උදෙසා වූ භාර අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර 2012 සැප්තැම්බර් 12 දින එළඹි අංක ටීඑෆ් 011617 දරන ප්‍රදාන ගිවිසුමේ සම්මත කොන්දේසිවල 2.07 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 අරමුදල ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා අරමුදලේ කාලය

-----------------------------------------------------------------------------------

භාර අරමුදලේ ප්‍රදාන ගිවිසුම අනුව, එවකට ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය භාර අරමුදල ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. භාර අරමුදල ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන්නේ නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා කොළඹ මහ නගර සභාවයි. ස්වභාවික ආපදාවලින් පීඩාවට පත්වන ශ්‍රී ලංකාවේ නාගරික පරිසරය හඳුනාගැනීම, තක්සේරු කිරීම හා අඩු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ ධාරිතාවය ඉහළ නැංවීම භාර අරමුදලේ අරමුණ වේ. ප්‍රදාන ගිවිසුම අනුව, භාර අරමුදලේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වන රු.මිලියන 118.80 කට සමාන එජඩො 900,000 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. භාර අරමුදල එහි කටයුතු 2012 සැප්තැම්බර් 12 දින ආරම්භ කරන ලද අතර 2014 ජුලි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. භාර අරමුදලේ මෙහෙයුම් කාල පරිච්ඡේදය පසුව 2017 ජනවාරි 31 දක්වා දීර්ඝ කර තිබුණි. භාර අරමුදලේ මූල්‍ය ප්‍රතිඵල ඒකාබද්ධ කර 2014 දෙසැම්බර් 31 දක්වා කොළඹ අග නගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ අතර 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ සිට ඉදිරියට භාර අරමුදල සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් භාර අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල භාර අරමුදල කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ භාර අරමුදලේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම භාර අරමුදල විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් භාර අරමුදල විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් භාර අරමුදලේ ප්‍රගතිය, භාර අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ ඩොලර් ගිණුමේ මූලික තැන්පතුව සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් භාර අරමුදල විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ භාර අරමුදලේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) භාර අරමුදල ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන
----------------

### 2.1 මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාර අරමුදල නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට භාර අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ ඩොලර් ගිණුමේ මූලික තැන්පතුව සහ ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් භාර අරමුදල විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව. සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත් ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------------

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ නියම කරන ලද පරිදි 2016 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 මැයි 27 දින දීය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

--------------------------------------

## 3.1 අරමුදල් උපයෝජනය

---------------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, 2015 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | 2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද ප්‍රතිපාදනය | 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ප්‍රදාන | 0.90 | 118.80 | 23 | 0.09 | 12.43 |
| | 0.90 | 118.80 | 23 | 0.09 | 12.43 |

## 3.2 භෞතික කාර්යසාධනය

--------------------------

ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, භාර අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කොළඹ අගනගර ආශ්‍රිත ඒකාබද්ධ ජල ගැලීම් අවදානම තක්සේරු කිරීම, කොළඹ අගනගර ආශ්‍රිත ජල ගැලීම් අවදානම අවම කිරීමේ උපාය මාර්ග හා ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීම, නියාමන හා ඇගයීම් පද්ධතිය සංවර්ධනය කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය හා පරිපාලනය නම් වූ සංරචක 04 ක් යටතේ භාර අරමුදලේ කාර්යයන් සිදු කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද එම කාර්යයන් සැලසුම් කළ පරිදි ආරම්භ කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අරමුදල් මූල්‍යායනය කිරීම සඳහා කාල පරිච්ඡේදය 2014 ජුලි 30 සිට 2017 ජනවාරි 31 දක්වා අවස්ථා 02 කදී තවත් වර්ෂ 2 ½ කින් දීර්ඝ කර තිබුණි. භාර අරමුදලේ ප්‍රගති වාර්තා අනුව, කොළඹ අග නගර ආශ්‍රිත නගර කලාපයේ තෙත් බිම් සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීමේ කාර්යය පමණක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් තෙත් බිම් ප්‍රදේශ සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීමට සහ කොළඹ අග නගර ආශ්‍රිත නගර කලාපය ඇතුළත රටමැද ජලමාර්ගවල හා වැව්වල ජලයේ ගුණාත්මක තත්ත්වය පිළිබඳ තක්සේරුවක් සිදු කිරීමට දේශීය හා ජාත්‍යන්තර උපදේශක සමාගම්වලින් ලංසු කැඳවා තිබුණි. උපදේශකවරුන් තෝරාගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පිළියෙල කරන ලද නිර්නායකයන්ට පටහැනිව, ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන් පිළිබඳ සුදුසුකම් සහිත හා පළපුරුදු ඉංජිනේරු කාර්ය මණ්ඩලයක් සහිත වෙනත් උපදේශක සේවා සමාගමකින් ඉදිරිපත් කරන ලද රු.මිලියන 17.09 කට සමාන එජඩො 129,860 ක් වූ අඩුම ලංසුව සැලකීමෙන් තොරව, රු.මිලියන 30.25 කට සමාන එජඩො 229,885 ක්වූ දෙවන අඩුම ලංසුව ඉදිරිපත් කරන ලද ජාත්‍යන්තර සමාගමකට උපදේශක සේවා කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.